WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තදකළ අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වචනය තෝරන්න.

**1.** **උඩක් බිමක් නොබලා** වැඩ නොකරන්නැයි ගුරුතුමා තම ශිෂ්‍යයාට අවවාද කළේ ය.
(1) වැඩිහිටි අවවාද නොතකා (2) අනුන්ගේ උපදෙස්වලින් තොරව
(3) කිසිවක් සොයා නොබලා (4) වටපිට නොබලා

**2.** සුමල්, ප්‍රදේශයේ ප්‍රචලිත ව ඇත්තේ **අනුන්ට ගිනි දෙන** කෙනකු ලෙසිනි.
(1) විපත් ඇති කරන (2) මුදල් ලබා දෙන
(3) ගින්දර ලබා දෙන (4) උදවුපදවු කරන

**3.** පසුගිය කාලයේ සිදු වූ දේවල් නිසා ඔහුගේ **තටු කැඩී ඇති බව** ගම්වැසියෝ පැවසූහ.
(1) මනස විකෘත වී (2) දුප්පත් වී
(3) අසනීප උග්‍ර වී (4) බලය පිරිහී

● අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

**4.** ලෝකප්‍රකට ක්‍රීඩිකාවක තමා අසල සිටිනු දුටු අමාලි .............................. පත් විය.
(1) වික්ෂිප්තභාවයට (2) සංකූලතාවට (3) සංවේදීභාවයට (4) සුරක්ෂිතතාවට

**5.** සාගරයේ රාත්‍රිය ගොඩබිමට වඩා .............................. ලෙසින් අලංකාර ය.
(1) අසදෘශ (2) පරිමිත (3) අපරිමිත (4) විස්මිත

**6.** මාර්ටින් වික්‍රමසිංහ සූරීන් සිංහල සාහිත්‍යයට කළ ..................... සේවය පැසසිය යුතු ය.
(1) වන්දනීය (2) සම්භාවනීය (3) අභිභවනීය (4) අනභිභවනීය

**7.** අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** යෙදී ඇති පද පෙළිය තෝරන්න.
(1) උෂ්ණත්වය, ඌෂ්මාක්ෂර, උල්ලංඝනය, උපදේශක
(2) කඩොලාන, කණ්ඩිය, කණිසම, කම්පනය
(3) ගාන්ධර්ව, ගිනිකොන, ගිම්හානය, ගුණධර්ම
(4) නිධානය, නිබන්ධනය, නැණසල, නේපථ්‍යාගාරය

**8.** සෑම පදයක ම අක්ෂර වින්‍යාසය **නිවැරදි ව** යෙදී ඇති පද පෙළිය තෝරන්න.
(1) මධ්‍යස්ථානය, තාක්ෂනය, අළුත්වැඩියාව, පළපුරුද්ද
(2) කළමණාකරු, විශ්වසනීය, වාච්‍යාර්ථය, ජනශ්‍රැතිය
(3) ශ්‍රේෂ්ඨ, පරිනාමය, පර්යේෂණ, අභිරුචිය
(4) අභිමත, සම්පස්ථ, පෙළපාලිය, ළයාන්විත

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

9. **අන්‍යාර්ථ සමාසයට** උදාහරණයක් වන්නේ,
(1) නැගෙනහිර ය. (2) පාසියුම් ය. (3) ඉම්හිරි ය. (4) කෘමිහානි ය.

10. 'ඔවුහු දරුවන්ගේ කෙළිසෙල්ලම් බලා සතුටු වූහ.' යන වාක්‍යයේ **කෙළිසෙල්ලම්** යනු,
(1) තද්ධිත පදයකි. (2) සර්වනාම පදයකි.
(3) යුගල පදයකි. (4) කෘදන්ත පදයකි.

11. **උක්ත නාමපද** පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) ක්‍රීඩිකාවක, මිනිස්සු, ශිෂ්‍යයෝ, නුඹ (2) අපි, තරුණයෝ, ළමයෙක්, නිලධාරිහු
(3) මම, වනමෘගයෝ, ගායිකාවක, තරුණයෙක් (4) ගායකයෙක්, අපේක්ෂකයන්, ඇතැමෙක්, පියාණෝ

12. **උපසර්ගයක්** රහිත පදයක් ඇති වරණය තෝරන්න.
(1) නිෂ්ප්‍රභ, පරදේශ, අයැදුම්, නිදුක් (2) ප්‍රතිඵල, පරිභ්‍රමණය, අභිනිෂ්ක්මන, අධිභාරය
(3) අනුකම්පුව, අන්ධකාර, නිර්ලෝභී, විසම (4) අවප්‍රමාණය, සදහම්, සංවර්ධනය, ඉමහත්

13. "සම්පූර්ණයෙන් විනාශ කිරීම" යන්න සඳහා යෙදිය හැකි **තනි පදයක්** දැක්වෙන වරණය කුමක් ද?
(1) වියෝජනය (2) විසංයෝජනය
(3) වීමංසනය (4) විධ්වංසනය

● අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල **තදකළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

14. සීගිරි ගී ලියූවන් අතර **විදග්ධ** කවීන් සිටි බව කියැවේ.
(1) විදේශීය (2) විශේෂ (3) නිපුණ (4) ප්‍රසිද්ධ

15. **යථෝක්ත** කාරණය පිළිබඳ ව සැලකිලිමත් වන ලෙස නිලධාරියා තම සේවකයන්ට දැන්වී ය.
(1) දන්වන ලද (2) කීමට අපේක්ෂා කරන
(3) ඉහත කියන ලද (4) විශේෂයෙන් කියන ලද

16. හොඳ සාහිත්‍ය නිර්මාණයක් බිහිවීමට සාහිත්‍යකරුවා තුළ **ව්‍යුත්පත්තිය** ද තිබිය යුතු ය.
(1) උචිත අනුචිත දේ තෝරා ගැනීමේ හැකියාව (2) අලුත් දේ නිර්මාණය කිරීමේ හැකියාව
(3) නිරන්තරව කරන අභ්‍යාසය (4) අත්දැකීම් බහුල වීම

17. මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) කෘදන්ත - නැටුම, ගයන්නේ, තොටිල්ල, පැවිල්ල
(2) සර්වනාම - අපි, එතුමා, ඔබ, ඔහු
(3) නිත්‍ය බහුවචන - ඇතැමෙක්, කෙනෙක්, අයෙක්, සමහරෙක්
(4) ක්‍රියා විශේෂණ - සෙමෙන්, වේගයෙන්, උවමනාවෙන්, අමාරුවෙන්

18. පූර්වස්වර ලෝප සන්ධියට උදාහරණයක් **නො වන** පදය තෝරන්න.
(1) දකුණත (2) මැදැඟිල්ල (3) දෑත (4) දිවැස

19. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ආලෝකය - අලු, ප්‍රභා, පහන්, කාන්ති (2) කැලෑව - වල, අරණ, ළන්ද, රුකුල
(3) පොකුණ - විල, තඩාග, සරසි, තළා (4) ප්‍රසිද්ධ - පසිඳු, විශද, පළ, ලකළ

20. **විරුද්ධාර්ථවත්** පද යුගලයක් **නො වන** වරණය තෝරන්න.
(1) ප්‍රපාතය – මස්තකය (2) සම්භාවනීය – නින්දනීය
(3) සංවෘත – ආවෘත (4) සාමූහික – ඒකල

21. **පූර්ව ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය තෝරන්න.
(1) හොඳින් පාඩම් කළහොත් විභාගය ජයගත හැකි වේවි.
(2) ක්‍රීඩකයා දුවද්දී ප්‍රේක්ෂකයෝ ඔල්වරසන් දුන්හ.
(3) ගායිකාව ගීයක් ගයමින් නර්තනයක යෙදුණා ය.
(4) මම පොත කියවා නිදාගත්තෙමි.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**22.** **වැරදි** අදහස සහිත වරණය තෝරන්න.
(1) වෛකල්පික යනු අනිවාර්ය යන පදයෙහි විරුද්ධාර්ථ පදයයි.
(2) නිපාත, වාක්‍යවල මැද පමණක් යෙදී අර්ථ ප්‍රකාශ කරයි.
(3) අසිරිමත් යන පදයේ මත් යනු තද්ධිත ප්‍රත්‍යයකි.
(4) කවිසිළුමිණ යනු සමාස පදයකි.

**23.** **ඌෂ්මාක්ෂර** පමණක් ඇතුළත් වන වරණය තෝරන්න.
(1) ක, ශ, ස, හ, ග
(2) ච, ට, ප, ත, ද
(3) ෂ, ෆ, ස, ළ, ව
(4) ශ, ෂ, ස, හ, ෆ

- අංක **24** සිට **26** තෙක් දී ඇති ප්‍රස්තාව පිරුළුවලට **වඩාත් ගැළපෙන** අදහස සහිත වරණය තෝරන්න.

**24.** ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගේ
(1) සාමූහික ව එක් වී යම් කාර්යයක් කිරීම
(2) අනුන් රැවටීමට ගොස් තමන් ම රැවටීම
(3) අර්ථ විරහිත කාර්යයක් සිදු කිරීම
(4) උත්සාහය මගින් ජයග්‍රහණය ලැබීම

**25.** නැග්ග ඉනිමගට පයින් ගැසුවා වගේ
(1) උපකාර ලබාගත් පසු උපකාර කළ තැනැත්තා අමතක කිරීම
(2) උපකාර කළ පසු ප්‍රත්‍යුපකාර අපේක්ෂා නොකිරීම
(3) ධනවත් වූ පසු දුප්පත් මිනිසුන් අමතක කිරීම
(4) ඉහළ නිලතලවලට පත් වූ පසු අනෙක් අයට නොසැලකීම

**26.** ඇටිකෙහෙල් කෑ උගුඩුවා වගේ
(1) තමන් කළ වරද තමන්ට ම දැනීම
(2) නොදන්නා දේ කිරීමට ගොස් අමාරුවේ වැටීම
(3) තමන් කළ වැඩ ගැන පසුතැවීමට පත් වීම
(4) දැන දැන ම වැරදි කර තමන් ම විඳ වීම

- අංක **27** සිට **29** තෙක් ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය** තෝරන්න.

**27.** (1) අපි දක්ෂ දරුවන් වෙමු.
(2) අප දක්ෂ දරුවෝ වෙමු.
(3) අපි දක්ෂ දරුවෝ වෙමු.
(4) අප දක්ෂ දරුවන් වෙමු.

**28.** (1) දෙමාපියන් සියල්ලෝ ම රැස්වීමට සහභාගි වෙති.
(2) දෙමාපියන් සියල්ලන් ම රැස්වීමට සහභාගි වෙති.
(3) දෙමාපියෝ සියල්ලන් ම රැස්වීමට සහභාගි වෙති.
(4) දෙමාපියෝ සියල්ලෝ ම රැස්වීමට සහභාගි වෙති.

**29.** (1) ගුරුවරු ළමයි කැටුව චාරිකාව ගියහ.
(2) ගුරුවරුන් ළමයි කැටුව චාරිකාව ගියහ.
(3) ගුරුවරු ළමයින් කැටුව චාරිකාව ගියහ.
(4) ගුරුවරුන් ළමයින් කැටුව චාරිකාව ගියහ.

**30.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට **වඩාත් නිවැරදි** ලෙස ලැබෙන වාක්‍යය තෝරන්න.
"අපි කතා කළා ම සමහර අය හිනා වුණා"
(1) අප කතා කළ විට සමහරු සිනාසුණහ.
(2) අපි කතා කළ විට සමහරෙක් සිනාසුණේ ය.
(3) අපි කතා කළ විට සමහරුන් සිනාසුණහ.
(4) අප කතා කළ විට සමහරුන් සිනාසුණහ.

**31.** පහත සඳහන් කවියේ **තදකළු** අකුරෙන් මුද්‍රිත පද සඳහා යෙදෙන අර්ථ පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

මෙ නිරිඳුගෙ දූ ළඳ
උලකුඩය දේවි **සඳ**
සොමි ගුණෙනි පුන් **සඳ**
පවති සිරි **සඳ** සිරින් ඇම **සඳ**

(1) කාන්තාව, චන්ද්‍රයා, උතුම්, කල්හි
(2) කල්හි, උතුම්, චන්ද්‍රයා, කාන්තාව
(3) උතුම්, චන්ද්‍රයා, කාන්තාව, කල්හි
(4) කාන්තාව, උතුම්, චන්ද්‍රයා, කල්හි

**32.** රූපකයක් සහිත වරණය තෝරන්න.
(1) පාළොස්වක සඳ පායනු වැන්නේ
(2) දුනුකෙයියා මලක් වගේ දුරට පෙනෙනවා
(3) වී පැදුරෙන් ඉගිලී යන කුරුල්ලකු ලෙසින්
(4) අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී

[හතරවැනි පිටුව බලන්න.

WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

* අංක **33** සහ **34** යන ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා **වඩාත් සමීප අර්ථය** දෙන වරණය තෝරන්න.

**33.** වැව මුල් කරගත් ජලාශ්‍රයකට විපතක් සිදු වේ නම් එය රටවැසි සියල්ලන්ට ම සිදු වන විපතක් වශයෙන් දූරාතීතයේ සිට ම සැලකිණි.

(1) ජල සම්පතට සිදු වන විපත් රටට ම සිදු වන විපතක් ලෙස අතීත කාලයේ දී සැලකිණි.
(2) වැවකට සිදු වන විපතක් රටවැසියන්ට සිදු වන විපතක් ලෙස සලකන්නට අතීත වැසියෝ පුරුදු වූහ.
(3) වැව මූලික කරගත් ජල සම්පතට විපත් සිදු වීම රටවාසින්ට සිදු වූ විපතක් වශයෙන් අතීතයේ පටන් ම සැලකී ය.
(4) වැව මූලික කරගත් ජල සම්පතට හානි සිදු වීම රටට ම වූ හානියක් බව අතීත කාලයේ දී සැලකිණි.

**34.** මුල් වකවානුවේ සිට හත්වැනි සියවස තෙක් ලියැවී තිබෙන සෙල්ලිපි එක් ගණයකටත් එතැන් සිට ලියැවී ඇති සෙල්ලිපි තවත් ගණයකටත් ඒවායේ භාෂා ලක්ෂණ අනුව වෙන් කළ හැකි ය.

(1) සෙල්ලිපි වර්ගීකරණයකට ලක් කළ හැකි අතර එහි දී ඒවායේ භාෂා ලක්ෂණ සැලකිල්ලට ගැනේ.
(2) ලියැවුණු කාලය අනුව සෙල්ලිපි කොටස් දෙකකට වෙන් කළ හැකි අතර එහි දී සැලකිල්ලට ගෙන ඇත්තේ ඒවායේ භාෂා ලක්ෂණයි.
(3) සෙල්ලිපි ලියැවී ඇති කාලය අනුව භාෂා ලක්ෂණ දක්නට ලැබෙන අතර ඒවා කොටස් දෙකකට වර්ග කර ඇත.
(4) සෙල්ලිපි ලියැවී ඇති භාෂාවේ ස්වරූපය අනුව ඒවා වර්ග දෙකකට වෙන් කිරීමට හැකියාව ඇත.

**35.** බ්‍රාහ්මී සෙල්ලිපිවල 'නාඩීර' යනුවෙන් සඳහන් කර ඇත්තේ,

(1) පොල් ය. (2) පුවක් ය. (3) තල් ය. (4) කොස් ය.

**36.** පහත සඳහන් ජනකවියේ හතරවැනි පදය දී ඇති වරණ අතුරෙන් තෝරන්න.

"සිටිති පෙළින් පෙළ රන්තරු විලසට
ගනිති එරන් කැති දහසක් එමවිට
දමති එරන් කැති මාරුව අහසට
......................................................"

(1) නළා පිඹිති දෙපසේ බෙර නදකොට
(2) වලා යටින් සඳ පෑයූ විලසට
(3) බලා සිටිති රජු ඇවිදින් එතනට
(4) කපති ගොයම් අඟනෝ බැස කුඹුරට

**37.** "වෙසක් කැකුළු අතු අග හිඳ නටන විලාසේ
ඉරෙත් හඳෙත් සිරි විඳ විඳ රඟන විලාසේ"

'රේඛාව' චිත්‍රපටය සඳහා නිර්මාණය කරන ලද ඉහත සඳහන් පද ඇතුළත් ගීතයේ පද රචකයා,

(1) ලූෂන් බුලත්සිංහල මහතා ය. (2) ගරු මර්සලින් ජයකොඩි පියතුමා ය.
(3) මහගම සේකර මහතා ය. (4) සුනිල් දයානන්ද කෝණාර මහතා ය.

**38.** පහත සඳහන් පද්‍යාර්ධයෙහි අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

"සොඳුරු තුරුණු සියපත් සිය රස් වතුර
ඉඳුරු දෙසින් වැද නුබ ගඟ එත පැතිර"

(1) සුන්දර වූ තරුණ සූර්යයාගේ රශ්මිය නමැති ජලය නැගෙනහිර දිශාවෙන් ආකාශ ගංගාවට වැදී පැතිරෙන කල්හි
(2) සුන්දර වූ තරුණ සූර්යයාගේ රශ්මිය නමැති වතුර දිව්‍ය ලෝකය දෙසින් ආකාශ ගංගාව කරා පැතිර ගොස්
(3) සුන්දර වූ තරුණ නෙළුම් මල් සිය රශ්මි නම් ජලය නැගෙනහිර දිශාවෙන් විහිදුවා ආකාශ ගංගාව කරා පැතිර ගොස්
(4) සුන්දර වූ තරුණ නෙළුම් මල්වල පෙති ජලය මත පා කර දිව්‍ය ලෝකය දෙසින් ආකාශය කරා පැතිර යද්දී

WWW.OLEVELAPI.COM

**39.** "ලෝ දහමින් වැදෙනා රළු පහරින්
ගත සිත රිදෙනා කල නිතියෙන්
නැත ලොවේ අන් රසඳුනා
ආදරේ සේ සුව දෙනා"

යන ගී ඛණ්ඩය ඇතුළත් වන්නේ,

(1) මනමෙ නාට්‍යයේ ය. (2) සිංහබාහු නාට්‍යයේ ය.
(3) වෙස්සන්තර නාට්‍යයේ ය. (4) නරිබෑනා නාට්‍යයේ ය.

**40.** වැවක් ජලයෙන් පිරීගොස් වාන් දමන අවස්ථාවේ වැවේ ජල පහර චණ්ඩ වන අතර එයින් වැවට සිදු වන විනාශය වළක්වා ගැනීමේ අරමුණින් වැවට අධිපති දෙවියන්ට බාර වී සිදු කරන පූජාව හැඳින්වෙන්නේ,

(1) මුට්ටි නැමිල්ල නමිනි. (2) නානුමුරය නමිනි.
(3) නිහර වී පූජාව නමිනි. (4) වැවේ රාජකාරිය නමිනි.

* *

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....